පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# දෙවන වාර පරීක්ෂණය - 2023
## සිංහල - I පත්‍රය

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ........................ කාලය : පැය තුනයි.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදාගන්න.

(අ) එකල බමුණාණෝ ආදා යවා තබාලා වල්පත ගත්තා සේ වෙදවරුන් ගෙන්වන අවස්ථාවේ රෝග හානියටත් වඩා වස්තුහානිය නොකැමතිව නොගෙන්වා අතෙකිච්ඡ අවස්ථාවෙහි වෙදාණකෙනෙකුන් ගෙන්වූය. ඌ අවුත් රෝග බලා සංහිඳුවන්ට බැරිනියාව දැන 'මා අවසර නැත. අනික් වෙද කෙනෙකුන් ගෙන්වා පිළියම් කරවන බව ය'යි කියාලා ගියෝය. උන් ගිය ගමනින් ම බමුණාණෝ පුතණුවන් මියන නියාව නියම කොට දැන 'මූ මළ කල එළවූවට ආ කෙනෙක් ඇතුළුගෙයි පුරා තුබූ සම්පත් දැක "මෙතෙක් සම්පත් තබාගෙන හිඳ දුප්පතා සේ පුතුට පිළියම් පමණකුත් නොකරවා නසාපීය".

(i) බමුණා වෙදවරුන් ගෙන්වන අවස්ථාවේ නොකැමති වූයේ කුමකට ද?

(ii) වෙදාණෝ 'අනෙකුත් වෙද කෙනෙකුන් ගෙන්වා පිළියම් කරවන්න' යැයි කියාලා ගියේ ඇයි?

(iii) "මූ මළ කල එළවූවට ආ කෙනෙක් ඇතුළුගෙයි පුරා තුබූ සම්පත් දැක" මෙය ලිහිල් බසින් ලියන්න

(iv) '**අතෙකිච්ඡ**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ආ) මෑණියෝ එ බස් අසා තමන් අතුරෙහි සිනා සී "මාගේ පුතණුවෝ තමන් ශ්‍රීමත් කුලයෙහි උපන් හෙයිනුත් මහපින් ඇති හෙයිනුත් නැතැයි යන බසෙහි අර්ථ නොදනිති. මපුතණුවන් මතු රාජ්‍යය කරන කල නැතැයි යන බසක් නොකියා රාජ්‍යය කළ නොහැක්කේ ම වේද. මපුතණුවන් නැතැ යි යන බසෙහි අර්ථ උගන්වමි'යි සිතාලා රන් තලියක් ශුද්ධකරවාපියා අනික් රන් තලියකින් වසාලා "තෙල නැති පූ මපුතණුවන්ට දෙව"යි කියා නිකම් තලිය යව්වාහුය. එකෙණෙහි එ නුවර අරක්ගත් දේවතාවා "මාගේ අනුරුද්ධ කුමාරයෝ මවු කුසින් උපන් දා පටන් නැතැ යි යන බසෙහි අර්ථ නොදන්නාහු ය".

(i) මෑණියන් තම පුතුට 'නැතැ'යි යන බසෙහි අර්ථය උගැන්වීමට සිතුවේ ඇයි?

(ii) මෑණියන් සිතන පරිදි කුමරු 'නැතැ'යි යන බසෙහි අර්ථය නොදන්නේ කුමක් නිසා ද?

(iii) "තෙල නැති පූ මපුතණුවන්ට දෙව" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) 'ශ්‍රීමත්' යන්නට කෙටි විවරණ සපයන්න.

(ඉ) එහි රිදී පවුහි වසන්නා වූ සඳකිඳුරෝ ද වැසි සාර මස පර්වතයෙන් නොබැස හිඳිති. ගිම් සාරමස ඒ පර්වත පාදයෙහි ඇවිදිති. ඒ කාලයට යට කියන ලද සඳකිඳුරු රජ්ජුරුවෝ තමන් කිඳුරංගනාව හා සමග පර්වතයෙන් බැස ඒ ඒ ස්ථානයෙහි සඳුන්හර කඩා ගා විලවුන් ගාන්නාහුය. තව ද මල් පට සඳහා වූ පොරෝනා වූ ලිය හෝ වැල්ලෙහි කෙළෙනා වූ මිහිරි ස්වරයෙන් ගී කියන්නාහු යට කියන ලද්දා වූ හොයට පැමිණ ඒ හොය ගොඩ තිබූ වැල්ලකට බැස...

(i) සඳකිඳුරු රජු කිඳුරිය සමග සඳුන් හර කඩා ගා විලවුන් ගාන්නේ කුමන කාලයට ද?

(ii) සඳකිඳුරෝ පර්වතයෙන් නොබැස සිටින්නේ කුමන කාලයට ද?

(iii) ''ඒ ඒ ස්ථානයෙහි සඳුන්හර කඩා ගා විලවුන් ගාන්නාහුය'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) ''**මල් පට**'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ඊ) මහත් වූ වීර්ය ඇති අනන්තඥානයෙන් යුක්ත වූ ස්වයම්භූඥානයෙන් සියල්ල ගෙවා දත්තා වූ මුළු ලොවට හිතාන්වෙසී වූ තුන්ලොවට අසහාය නායක වූ ලෝක ස්වාමී වූ අනාථ නාථ වූ භාග්‍යවත් වූ ත්‍රෛලෝක ශාසතෘ වූ බුදුරජානන් වහන්සේ උදෙසා දැන් මා විසින් පුදන ලද්දා වූ මේ මල් පූජාවෙහි අනුසසින් මතු සසර මම උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති වෙම්වා යි මනොඥ වූ ආරෝහ පරිණාහයෙන් යුක්ත වෙමව යි ශරත් කාලයෙහි ගුවන් මැද දිලියෙන සූර්ය මණ්ඩලය පරිද්දෙන් මාගේ සියළඟින් රශ්මි මාලාවෝ විහිදෙත්වා...

(i) මතු සසර උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති වෙම්වා යි ප්‍රාර්ථනා කරන්නේ කිනම් කුසලයක් කළ නිසා ද?

(ii) සිරුරෙන් රශ්මිය විහිදිය යුත්තේ කුමන ආකාරයට ද?

(iii) ''මනොඥ වූ ආරෝහ පරිණාහයෙන් යුක්ත වෙම්වා'' යි යන්න ලිහිල් බසින් ලියන්න.

(iv) ''**සියළඟින්**'' යන්නට කෙටි විවරණ සපයන්න.

(උ) සුවඳ කුසුම් වරලසෙහි
පැළඳ කපුරු හර උරෙහි
නොමඳ බරණ ලා සැරහි
නිබඳ කෙළිති ලියො පුරෙහි

ඉසුරෙන් ඉඳුරු පුර
පසුකරන සව්සිරි බර
බරණැස් නම් පවර
පුරෙක් විය දඹදිවෙහි පුවතර

(i) ක්‍රීඩා කරන ලියන් උරෙහි පැළඳ සිටියේ කුමක් ද?

(ii) කවියා දක්වා ඇති පරිදි බරණැස් පුරයෙහි ලක්ෂණ කවරේ ද?

(iii) ''නොමඳ බරණ ලා සැර සී - නිබඳ කෙළිති ලියො පුරෙහි'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**ඉඳුරුපුර**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 4×4 = 16 යි)

- (ඉ) සහ (ඊ) ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සපයන්න.

(ඉ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුරැ උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ"

(ii) "තවද පවිටු වූ රජ තාගේ මව් ද තා නොදැක සොහොන් වදී ව යි"

(iii) "ඔව් මිනිහෝ අද නඩුවක් තියෙනවා"

(iv) "සතුරන් සහසක් කළ ද පරාජය

තමහට තම සිත වේ පස මිතුරා"

(v) "හුණු කැමති සිසිල ලැබේ ල සිසිල කැමති හුණු ලැබේ ල"

(vi) "උඹේ මේ පුංචි බඩට ඇති වෙන්ට කෑම නැද්ද ඒකේ?"

(vii) "අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීයහ මානයෙන්ම මඩනා ලදහ"

(ලකුණු 3×4 = 12 යි)

(ඊ) භාෂා භාවිතයෙහි සහ වස්තු විෂයෙහි ඔබ දකින විශේෂතා පැහැදිලි කරමින් පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි සාහිත්‍යමය අගය විමසන්න.

**ඉගිළෙන සිහින**

මිනිහා නගන කටහඬ නො ම වැකෙන කනේ
ඈත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු වන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මවුපිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජමුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිළෙන්නට නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැති ව සැපතක් ඇති විය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුවසිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

මවුපිය කුරුල්ලන් ආහර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින අටින්
දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගිහින් එළි වෙන කොට හතර වටින්

(ලකුණු 12 යි)

2. පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(අ) දඹදෙණි - කුරුණෑගල අවධිවලදී ශ්‍රාවක මනසේ ශ්‍රද්ධාව වර්ධනය වන ආකාරයට බණ කතා රචනා කිරීම නව ප්‍රවණතාවක් ලෙස මතුවිය. උදාහරණ සහිතව මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 7 යි)

(ආ) චිත්ත රූප මවමින් ශ්‍රාවකයා ඇද බැඳ තබාගැනීමට සද්ධර්මරත්නාවලී කතුවරයා භාෂාව භාවිතයේදී දැක් වූ සමර්ථතාව මට්ටකුණ්ඩලී කතාව ඇසුරින් විස්තර කරන්න.

**නැත හොත්**

ශ්‍රාවක සිත් ග්‍රහණය කරගන්නා ආකාරයට අවස්ථා හා සිද්ධි නිරූපණයෙහිලා කතුවරයා දැක්වූ කුසලතාව චන්දකින්නර ජාතකය ඇසුරෙන් විමසන්න.

(ලකුණු 8 යි)

3. පුද්ගල මනෝභාවයන් අපූර්වත්වයෙන් ඉදිරිපත් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා උත්සාහගෙන ඇති අයුරු ස්වර්ණතිලකා වස්තුව ඇසුරෙන් විමසන්න.

**නැත හොත්**

**'**කෙබඳු සමාජ තලයක ජීවත්වන පුද්ගලයෙකු වුවද, පරිසර අත්දැකීම් ලබමින් ජීවත් වීම වැදගත් වේ'
මෙම පණිවුඩය සමාජගත කිරීමට පූජාවලි කතුවරයා දරා ඇති උත්සාහය අනුරුද්ධ කුමාර කතාව ඇසුරින් පහදන්න.
(ලකුණු 15 යි)

4. ''සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගයකි කෝට්ටේ යුගය'' මෙම කියමන නිදර්ශන සහිතව සනාථ කරන්න.
(ලකුණු 15 යි)

5. 'සොබාදහමේ අභියෝගවලින් පීඩා විඳින ජන සමාජයක තොරතුරු බැද්දේගම නව කතාව තුළින් පිළිබිඹු වේ' උදාහරණ සහිතව මෙම කියමන සාකච්ඡා කරන්න.
(ලකුණු 15 යි)

6. සිංහල කෙටිකතාව එක් එක් අවධිවලදී විකාශනය වූ අකාරය පිළිබඳ සංෂිප්ත විවරණයක් කරන්න.
(ලකුණු 15 යි)

7. කොළඹ යුගයේ ප්‍රථම තරංගයේ කවීන් වඩාත් ප්‍රිය කළ කාව්‍ය තේමා හා කාව්‍ය ලක්ෂණ පිළිබඳ පද්‍ය පන්ති දෙකක්වත් ඇසුරින් උදාහරණ දෙමින් පැහැදිළි කරන්න.
(ලකුණු 15 යි)

8. සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(ලකුණු 15 යි)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# දෙවන වාර පරීක්ෂණය - 2023
# සිංහල - II පත්‍රය

පාසලේ නම : ......................................................................................................

ඇතුළත්වීමේ අංකය : ........................................

කාලය : පැය තුනයි.

**උපදෙස්** අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

- I කොටසේ **1** ප්‍රශ්නය ද, II කොටසේ **2,3** ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට **හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 **ක ඛ ග ඝ** යන අක්ෂර හඳුන්වන නාමය වන්නේ

(1) මූර්ධජ අක්ෂර (2) ඕෂ්ඨජ අක්ෂර
(3) කණ්ඨජ අක්ෂර (4) තාලුජ අක්ෂර
(5) දන්තජ අක්ෂර (........)

1.2 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) බුරුත, නැඳුන්, කළුවර, තේක්ක
(2) කිතුල්, දුනුකේ, වැටකේ, සපු
(3) අරලිය, ඇසළ, සේපාලිකා, රුක් අත්තන
(4) නාරං, දෙහි, දොඩම්, බෙලි
(5) කොස්, අඹ, පේර, පොල් (........)

1.3 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) පිළිවෙත්, පිළිබඳ, පිළිවෙළ, පිළිතුරු
(2) හිතෛෂී, කෞශල්‍ය, ශාස්ත්‍රධරත්වය, ප්‍රතිලාභය
(3) ශ්‍රේෂ්ටතම, රාශියක්, ශාස්ත්‍රීය, වෘත්තීය
(4) වෛකල්පික, නෛසර්ගික, ශෛලීගත, දෛවෝපගත
(5) ශ්‍රේෂ්ය, කණිෂ්ය, විශිෂ්ය, ජොෂ්ය (........)

1.4 පහත සඳහන් වරණ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යංශය ර් යන්නට පරව යෙදිය හැක.

(2) අත්තඃස්ථ අක්ෂර වර්ගාක්ෂරවලට අයත් වේ.

(3) බ ය ඨ ඵ යනු අඝෝෂ මහාප්‍රාණ වේ.

(4) වර්ගාන්ත අක්ෂර සඤ්ඤක අක්ෂර ලෙසද හඳුන්වයි.

(5) විසර්ගය ඝෝෂ අක්ෂරයකි. (........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) කනිෂ්ඨ විදුහල, ස්ථිර අදිටන, රඟහල, සොයුරු පෙම

(2) කල්‍යාණි ගඟ, ගන අඳුර, අවමඟුල් උත්සවය, යුද සේනාව

(3) සූර්ය රශ්මිය, මන්දමාරුතය, වියරණ ග්‍රන්ථය, ශක්‍ර දෙවිඳු

(4) කුළුණු සිත, සාරභූමිය, ඇඳුරු මඬුල්ල, සාගර ජලය

(5) චන්ද්‍ර මඬල, හිරු රැස්, අභිමාන සිත, මූලධර්මවාදය (........)

1.6 ගයනුකිත්ත, දීර්ඝ පාපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, රකාරාංශය සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ගෞරවය, මූලාසනය, කෘත්‍රිම, ප්‍රධාන

(2) කෞශල්‍ය, රූන, පෘථිවිය, ක්‍රමය

(3) වෛර, රුක්ෂ, ටූපය, ශ්‍රමය

(4) පෞද්ගලික, භෘංග, ධූම, භ්‍රමණය

(5) භෞමික, ප්‍රමාණ, ශූර, දෘඪ (........)

1.7 තත්සම වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) වක්‍රය, සර, දහම, පාඨශාලාව

(2) දර්ශන, ඖෂධ, රක්ත, භෝජන

(3) සක්, විශේෂ, සොයුරු, සිදත

(4) ලෝක, පණ, ධර්ම, හිස

(5) ප්‍රවෘත්ති, මිහිකත, මිනිස්, ශෛලමය (........)

1.8 මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) සුළඟ - නල, පවන, මරු, මාරුත

(2) නිරතුරු - නිබඳ, නිතර, නිති, නිරන්තර

(3) සමුද්‍රය - සයුර, සිඳු, රුවනාර, සමුදුර

(4) ආපදාව - පිරිපත, ව්‍යසනය, මුක්තිය, විපත්තිය

(5) නයන - නේත්‍ර, නුවන්, ලෝචන, නෙත් (........)

1.9 මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) විකසිත - මිණිමුතු, පුබුදු, පුල්,පිපි

(2) විශාල - මහත්, තුමුල, විසල්, දැවැන්ත

(3) සන්තාපය - දොම්නස, කණගාටුව, ප්‍රහර්ෂය, සිත් තැවුල

(4) නිරතුරු - නිබඳ, නිතර, සතත, නිති

(5) මුග්ධ - අඥාන, දද, මෝඩ, අවියත් (........)

1.10 කෘදන්ත පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) කැපිලි, කැවිලි, බැලිලි, කෙටිලි

(2) නැටුම්, ගැයුම්, කියුම්, වැයුම්

(3) බලන, වයන, නයන, කියන

(4) මැරූ, දිරූ, තේරූ, වැපිරූ

(5) බට, නට, වට, දුට (........)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පුතණු, පාපතර, මින්රළ, මුහුළස

(2) විධිමත්, නෛතික, ප්‍රාථමික, දේශීය

(3) දැහැමි, රුමත්, ආදර්ශවත්, නැකති

(4) කඩිති, කළටි, ගරුතර, වකුටු

(5) සුහදතා, පහළ, සිහිති, ධනවත් (........)

1.12 පහත සඳහන් උදෘතවල තදකළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ග පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ගොවියෝ දරුවන් ලවා ගොයම් **කපවති.**

(ආ) **අස** දැන් ත යන මග සළකුණු මෙතැන් සිට.

(ඉ) සත්මහලින් **බැස** එන්නම්.

(ඊ) හිරු **නැගෙත** නෙලුම් පිපේ.

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(2) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(3) ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(5) විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා (........)

1.13 උපසර්ගයක් යෙදී නැති පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) කුපුරිස්, අභිමුඛ, සහජාත, අපවත්

(2) අභ්‍යවකාශ, දුශ්ශීල, ප්‍රතිලාභ, විදේශ

(3) වාසනාවන්ත, ප්‍රතිගාමී නිරුදක, අදූරදර්ශී

(4) සුකුමාර, අත්‍යුත්තම, ඉපැරණි, උදුල

(5) සන්නිවේදන, පිළිවදන්, අවගුන, පරිපූර්ණ

(........)

1.14 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) කිම, මන්ද, ය, යි

(2) මෙන්, යළි, විනා, සඳහා

(3) අද, එදා, හෙට, ඊයේ

(4) අහ, අනේ, අපොයි, ඌයි

(5) උදෙසා, සඳහ, විදහා, විලස (........)

1.15 '**නාගරික** ඇළ මාර්ග **ප්‍රතිසංස්කරණයට නගරාධිපතිතුමා** මහඟු මෙහෙයක් කළේ ය'

ඉහත වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, උපසර්ග, තද්ධිත

(2) තද්ධිත, උපසර්ග, සන්ධි

(3) තද්ධිත, නිපාත, සන්ධි

(4) තද්ධිත, උපසර්ග, නිපාත

(5) තද්ධිත, සන්ධි, උපසර්ග (........)

1.16 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) පුවත, බලත, කියත, නටත

(2) බබළයි, විකුණයි, පායයි, පිපෙයි

(3) දුව දුවා, බල බලා, අස අසා, නටනවා

(4) ඉඳ, විඳ, සිඳ, බිඳ

(5) බැලුවේ ය, කළා ය, ඇඹරුවා ය, ලිව්වා ය (........)

1.17 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පොත්පත්, ඉරහඳ, මුහුදුවැලි, රටවැසි

(2) බිඟුනද, සතුරුඋවදුරු, හෙළදිව, රන්කම්

(3) සුදන, අකුසල්, බහුතරය, සියපත

(4) දරුසෙනෙහස, බුදුගුණ, අධිපති, ලඹසවන්

(5) නිලුපුල්, නයිවිස, තිනෙත්, ගුරු පඬුරු (........)

1.18 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) අස්සන, දඩයම්, දඬුවම්, නෙලුම්මල්

(2) ග්‍රාමෝදය, දෙවහන, දෑත, වටොර

(3) ගොක්කත්ත, පොල්ලත්ත, දූප්පත්, කොග්ගල

(4) මුණිතුමා, නිලඹර, මලසුන, පුදසුන

(5) අම්මල්, නියංසාය, මිහින්තලය, ළිංවතුර (........)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

(1) ඇතැමෙක් විනෝදයට නොයෙක් නැටුම් නටති.

(2) අපි වෛද්‍යවරයෙක් හමුවීමු.

(3) සතුරෝ ගමට ඇතුළු වෙති'යි අපි නොසිතමු.

(4) සෞඛ්‍ය නිළධාරීන් නොරෝනා වසංගතය මර්දනය කළහ.

(5) සුනාමියෙන් බොහෝ සම්පත් විනාශ වූහ. (........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

(1) එහා ගමේ අලකලන්වියක් වෙලා.

(2) මා පොත් ටිකත් අරන් පාසල් යමි.

(3) අපි ඔක්කොම එකටම යමු.

(4) සමහරු ඉතා උනන්දුවෙන් ඉගෙන ගනිති.

(5) ටිකක් වේලාසන ගෙදර එන්න. (........)

## II කොටස

- මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මනුෂ්‍යයෝ නිසර්ගයෙන් ම විසිතුරු විරිත්වලින් බැඳී පද්‍යයන්ට කැමැත්තෝ වෙති. මේ හෙයින් ම උගත් නූගත් බාල මහලු බොහෝ දෙනා තමන්ගේ විවේක කාලය සිංදුවක් හෝ සිවුපදයක් කියමින් ගත කරති. නොයෙක් කරුණු මුල් කරගෙන බඳනා ලද, අර්ථ රසයෙන් වැඩි පොහොසත් බවක් නැති, ශාස්ත්‍රයෙන් බොහෝ දුර වූ සිවුපද පත්‍ර සිය දහස් ගණනින් දිනපතා අලෙවි වීමට හේතුව ද යට කී නෛසර්ගිකත්වය ම වේ. මනුෂ්‍ය ස්වභාවය මෙබඳු වන හෙයින් බුද්ධි ප්‍රබෝධයෙන් ප්‍රභූ වූ, පද්‍ය බන්ධනයෙහි යෙදෙන ශ්‍රේෂ්ඨ කවියෙකු විසින් මනුෂ්‍යයන් අතර පැවැත්විය හැකි බලය ද අති මහත් වේ. මැළිකම් මහහරවා ජාතීන් නඟා සිටුවීමට ද, වෙනස් නොකළ හැකි සේ මුල් බැසගෙන පරම්පරාගත ව පැවත එන අදහස් වෙනස් කිරීමට ද සත් කවීන්ගේ පද්‍යයෝ සමර්ථ වෙති. මිතුරන් සුවපත් කිරීමටත් සතුරන් දුප්පත් කිරීමටත් ශාස්ත්‍රානුකූල ව නිබන්ධ පද්‍යයෝ අතිශයෝපකාරී වෙත්ය; යනු බොහෝ සිංහලයන් අතර මුල් බැසගත් අදහසකි. උසස් කවියෙකු වීමට නම් නෛසර්ගික ප්‍රතිභානය ද, බහුශ්‍රැත භාවය හා නිරන්තර අභ්‍යාසය ද අවශ්‍ය වේ. නෛසර්ගික ප්‍රතිභානය නම් අතීත ජාතීන් හි කාව්‍යාලංකාරාදිය සේවනය කිරීමෙන් වූ වාසනා බලයෙන් ඇති වෙන වහා වැටහෙන නුවණයි. යථෝක්ත මනෝහර දර්ශනාදිය ඒ ප්‍රතිභාන සංඛ්‍යාත ප්‍රඥාව වැඩීමට හේතු වේ. උසස් කවීන් ඇති වීමට මේ ප්‍රතිභානය ඉවහල් වන හෙයින් මීට කවිත්ව බීජ යැයි ද කියනු ලැබේ.

(i) සැම කෙනෙක් ම තම විවේක කාලය සිංදුවක් හෝ සිවුපදයක් කියමින් ගත කරනුයේ කුමක් හෙයින් ද?

(ii) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට නෛසර්ගිකත්වය හේතුවෙන් අලෙවිවන සිවුපද පත්‍රවල ලක්ෂණ මොනවා ද?

(iii) හොඳ කවීන්ගේ පද්‍යාන්වලින් සමාජයට කළ හැකි මෙහෙය කෙබඳු ද?

(iv) මෙහි දැක්වෙන පරිදි සිංහලයන් අතර මුල් බැසගත් අදහස කුමක් ද?

(v) උසස් කවියකු වීමට තිබිය යුතු අවශ්‍යතා මොනවා ද?

(vi) නෛසර්ගික ප්‍රතිභානය යනු කුමක් ද? (ලකුණු 12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සිංහල භාෂා ව්‍යවහාරයෙහි දක්නට ලැබෙන විශේෂත්වයක් නම් භාෂණය සඳහා එක් භාෂා රටාවකුත්, ලේඛනය සඳහා තවත් භාෂා රටාවකුත් භාවිත කිරීමයි. ලේඛන භාෂාව වුව ද විමසා බලන විට පෙනී යන්නේ කාලයක් තිස්සේ ඇති වූ විපරිණාමයක ප්‍රතිඵලයක් වශයෙන් පැරණි ලේඛනය හා නූතන ගද්‍ය ලේඛනය අතර විශාල වෙනසක් දක්නට ලැබෙන බවයි. පැරණි සෙල්ලිපි භාෂාව හා දොළොස්වන හා දහතුන්වන සියවස්වල ලිය වී ඇති ගද්‍ය සාහිත්‍යය ග්‍රන්ථයන්ගේ භාෂාව අතර සැලකියයුතු වෙනසක් පෙන්නුම් කරන්නේ කාලයත් සමඟ ඇති වුණු භාෂා විපරිණාමය හේතුකොට ගෙනයි. ඉහත කී සියවස්වල ලියවුණ ගද්‍ය ග්‍රන්ථයන්ගේ භාෂාවට වඩා වර්තමානයේ ලිවීමට ගනු ලබන භාෂාව වෙනස් ස්වරූපයක් ගන්නා බව පැහැදිලි ලක්ෂණයකි. ලිඛිත භාෂාව මෙසේ අනුක්‍රමයෙන් වෙනස් වන්නේ කථා ව්‍යවහාරයේ බලපෑම අනුවයි. ඉන්දියාව පුරා විහිදී ගිය වෛදික සංස්කෘතියෙන් ප්‍රාකෘත භාෂා රාශියක් බිහි වී ව්‍යාප්ත වී ගියෙත් කථා ව්‍යවහාරයේ බලපෑම නිසයි. ප්‍රාකෘත භාෂා වර්තමාන ඉන්දියානු භාෂා බවට පරිවර්තනය වීමේ දී බෙහෙවින් බල පා ඇත්තේ ද මේ හේතුව ම ය. සිංහලේ ස්වරූපය ද එසේමයි. ලේඛන භාෂාව ක්‍රමයෙන් ව්‍යවහාර භාෂාවට අනුගත ව හැඩ ගැසෙන ආකාරය දහතුන්වන සියවසේ ලිය වී ඇති සද්ධර්මරත්නාවලිය වැනි කෘතීන්ගෙන් පෙන්නුම් කෙරේ.

(ලකුණු 13 යි.)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 – 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) පරිසර හිතකාමී සංවර්ධන වැඩපිළිවෙළක කාලීන අවශ්‍යතාව

(ii) රටක උන්නතිය කෙරෙහි සෘජුව බලපෑම් කරන පක්ෂ දේශපාලනය

(iii) කොරෝනා වසංගතය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බලපාන ආකාරය

(iv) ඖෂධ හිඟය හා ශ්‍රී ලංකාවේ ජන ජීවිතය

(v) නව තාක්ෂණික උපාංග භාවිතය ප්‍රචලිත කිරීමෙන් අධ්‍යාපනය කෙරෙහි ඇති කෙරෙන බලපෑම

(ලකුණු 25 යි.)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

(i) ඇගේ මුහුණ පියුමක් මෙන් බබළන්නී ය.

(ii) අඳුරු වලාවෝ නිල් ගුවන් ගැබ වසා ගති.

(iii) අපි පාරේ දකුණු පසින් ගමන් කළ යුතු ය.

(iv) ආරාධිතයෝ පැමිණෙද්දී පිරිස හුනස්නෙන් නැගී සිටිහය.

(v) මහගමසේකර කවියෙක් මෙන් ම චිත්‍ර ශිල්පියෙක් ද විය.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) සුභසාධක සංගමය සාමාජික සාමාජිකාවන් දැනුවත් කරයි.

(ii) නාහිමියෝ උත්සවයේ මුලසුන හෙබවූහ.

(iii) කුඩා දරුවෙක් උත්සව භූමියට මා කැඳවාගෙන ගියේය.

(iv) ශිෂ්‍ය ශිෂ්‍යාවෝ නව විදුහල්පතිනිය සාදරයෙන් පිළිගනිති.

(v) පොලිස් නිලධාරීහු සැක කරුවන් උසාවියට ඉදිරිපත් කලහ.

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (කම්කරුවෝ/කම්කරුවන්) පොරොන්දු වූ පරිදි දින දහයකින් ම වැඩ නිම (කළේය/කළහ)

(ii) සිංහල භාෂා (ගුරුවරියක්/ගුරුවරියක) කිහිපවරක් (මා/මම) ඇමතුවාය.

(iii) ගීත (රචකයෝ/රචකයන්) වනාහි අසිරිමත් සිතුවිලි (මවන්නෝ/මවන්නන්) යැයි හඳුන්වා දෙති.

(iv) (අපි/අප) කිහිපදෙනෙක් (නිළියක්/නිළියක) හමුවීමට ගියෙමු.

(v) (විචාරකයෙක්/විචාරකයෙකු) වූ එතුමා ව්‍යක්ත (දේශකයෙක්/දේශකයෙකු) ද විය.

(ලකුණු 5×3 = 15 යි)

5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **විශිෂ්ට** ගීත රචකයෙකු වූ මහගමසේකර **මහතාගේ** නිර්මාණ ගීත සාහිත්‍ය **ප්‍රභාවත්** කළේ ය. (විශිෂ්ට - උපසර්ග, මහතාගේ - විභක්ති, ප්‍රභාවත් - තද්ධිත)

(ii) **ළාහිරු පායද්දී වනමල්** විකසිත වේ. (ළාහිරු - සමාස, පායද්දී - ක්‍රියා, වනමල් - සමාස)

(iii) **නීලෝත්පල** වනයෙහි **සරන** බිඟුන්ගේ නදින් **වනසත්තු** මුසපත් වූහ. (නීලෝත්පල - සන්ධි, සරන - කෘදන්ත, වනසත්තු - සමාස)

(iv) දරුවෝ **ඔවුනොවුන්** දෙස **බලා බොකුටු** කොණ්ඩ කපා ගත්හ. (ඔවුනොවුන් - සන්ධි, බලා - ක්‍රියා, බොකුටු - තද්ධිත)

(v) සසර සරන **තුරු සුදන** ඇසුරම **ලබම්වා !** (තුරු - නිපාත, සුදන - උපසර්ග, ලබම්වා - ක්‍රියා)

(ලකුණු 3×5 = 15 යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) කොරෝනා වසංගතයෙන් අසරණ වූ පවුල් කෙරෙහි... නිලධාරී මහතාගේ ඍජු අධීක්ෂණය යොමු විය.

(ii) රූපවාහිනියේ... පුවත් විකාශනය වන්නේ දේශීය පුවත්වලින් අනතුරුවයි.

(iii) කිරි... ළමයි නිහඬවම සැතපෙති.

(iv) .... රාජ්‍ය නායක හමුව ජිනීවාහි දී ආරම්භ විය.

(v) .... නියම්ගම් පුරා කොරෝනා වසංගතය ව්‍යාප්ත විය.

(vi) ඔහුගේ කථාවට බොහෝ දෙනා... වූහ.

(විදේශීය, උරණ, ග්‍රාම, උරන, විදෙස්, ගම්) (ලකුණු ½ × 6 = 3 යි)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) වෙද + ඇදුරු

(ii) ලිප් + ගල

(iii) සුණු + කම්

(iv) වැලි + අවුරු

(v) මුනි + ඉන්ද්‍ර

(vi) පිළි + උතුරු (ලකුණු ½ × 6 = 3 යි)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **පාලකයිනි**, කම්කරු **ජනතාවගේ** අයිතීන් සුරකිනු මැනවි.

(ii) සිංහලයෝ **දිළින්දන්ට** රස **බොජුන්** දුන්හ.

(iii) **ඔහු පොරොවෙන්** ගස් කැපුවේ ය.

(ලකුණු ½ × 6 = 3 යි)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) ක්‍රිව 8 – 18 දක්වා කාලය මධ්‍යතන සිංහල අවධියයි

(ii) අද මාගේ මන දොළ මුදුන් පැමිණෙන්නේ යැයි දේවතාවා සිතීය

(iii) අයියෝ දැන් ඉතින් අප්පොච්චි එල්ලා දමයි ද

(ලකුණු ½ × 6 = 3 යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මට මෙහි නවාතැන් දෙන්න" යි ආගන්තුකයා කීවේ ය.

(ii) "අපි සියලු දෙනා විභාගය උසස් ලෙස සමත්වෙමු" යි ශිෂ්‍යයෝ ප්‍රකාශ කළහ.

(iii) "සිංහල ව්‍යාකරණ රීති හොඳින් අධ්‍යනය කළ යුතුය" යි භාෂාවේදී හු ප්‍රකාශ කළහ.

(ලකුණු 1×3 = 3 යි)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ඇසළ** පෙරහැර ආගමික මෙන් ම ජාතිකෝත්සවයක් ලෙසින් ද අගය කළ හැකි ය. එදා සිංහල රජුන්ගේ අනුග්‍රහය ලැබුණු එය රටේ ඉහළ ම **සංදර්ශනය** ලෙසින් පැවැත්වීමට කාර්ය සංවිධානය කොට තිබිණි.උඩරට නැටුම හා අනෙක් ජන නැටුම් ආරක්ෂා වීමට ඇසළ පෙරහැර අනුබලයක් විය.නොයෙක් කලාකරුවෝ පෙරහැර සඳහා තම සේවාව ලබා දුන්හ. පුදපූජා සඳහා කපු පරපුර මෙන් ම විවිද **කලාකරුවන්ගේ** පරපුර ද ආරක්ෂා වූයේ ඔවුනොවුන් සාමූහිකත්වයෙන් හා භක්තිමත් ක්‍රියාකාරීත්වය සපයමින් පෙරහැරට දායකත්වය සැපයූ හෙයිනි. විදේශිකයන්ගේ පාලන සමයේ දී රාජ්‍ය අනුග්‍රහය නො ලත් හෙයින් ජාතික **සංස්කෘතික** හරයන් **අභාවයට** යා නො දී රැක ගත හැකි වූයේ ද ඒ නිසා යැයි කිව හැකි ය. ඒ අවධියේ දී **මහනුවර** සිව් දේවාලයන්හි පෙරහැර පැවතුණ ද කීර්ති ශ්‍රීරාජසිංහ සමයේ ඇති වූ ආගමික පුනර්ජීවයේ ප්‍රතිඵලයක් ලෙස දළදා මාලිගයේ පෙරහැර සම්භන්ධ කොට එයට **බෞද්ධාගමික** හැඩරුවක් ද ගැන් වූ බව කියැ වේ.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) හැඩරුවක්, සංස්කෘතික, කියැවේ යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. රකාරාංශයක් හා අඝෝෂ අල්පප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක්.

2. මහප්‍රාණ අක්ෂරයක් හා නාසික්‍ය අක්ෂරයක් සහිත වචනයක්.

3. අනුස්වාරය හා අන්තඃස්ථ අක්ෂරයක් සහිත වචනයක්.

(iv) පහත සඳහන් පද විසන්ධි කර සංධි විධිය දක්වන්න.

ජාතිකෝත්සවයක්, ඔවුනොවුන්, බෞද්ධාගමික

(v) පහත දැක්වෙන පද වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත කාල බහුවචනයක්), තද්ධිත පද

(ලකුණු 3×5 =15 යි)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අව්‍ය සමාසය

(ii) මිශ්‍ර ක්‍රියා

(iii) ඌෂ්මාක්ෂර

(iv) පරරූප සන්ධිය

(v) නාසික්‍ය අක්ෂර

(ලකුණු 5×3 = 15 යි)

## සිංහල 12 ශ්‍රේණිය

## දෙවනවාර පරීක්ෂණ - පිළිතුරු පත්‍රය

## 1 පත්‍රය

1. (අ)

(i) වස්තුව හානි වනවාට

(ii) රෝගය උත්සන්න වී ඇති බැවින් සුව කිරීමට නොහැකි නිසා

(iii) මොහු මියගිය විට මළ ගෙදරට (අවසන් කටයුතු කිරීමට/ඉලව් ගෙදරට) පැමිණි කෙනෙක් ගේ ඇතුලේ පිරී ඇති සම්පත් දැක

(iV) අසාධ්‍ය (පිළියම් කළ නොහැකි/සුව කළ නොහැකි)

(ආ)

(i) මතුවට රාජ්‍ය කරන කාලයක 'නැතැ'යි යන්න නොදැන (නැත යන බස නොකියා) රාජ්‍ය කිරීමට නොහැකි නිසා

(ii) පොහොසත් කුලයෙහි උපන් නිසාත් මහා පින් ඇති නිසාත්

(iii) මේ නැති කැවුම් මාගේ පුතාට දෙන්න

(iv) පොහොසත්/ධනවත්/ධනය ඇති

(ඉ)

(i) ගිම්සාර මස/ගිම්හාන මාස හතරෙහි

(ii) වැසි සාර මස/වැසි මාස හතරේ

(iii) ඒ ඒ තැන් වල සඳුන් හරටු කඩා සුවඳ විලවුන් ගාන්නාවූ ය.

(iv) මලින් කළ වස්ත්‍ර

(ඊ)

(i) බුදුරජාණන් වහන්සේ උදෙසා මල් පූජා කළ අනුහසින්

(ii) සරත් කාලයෙහි අහස මැද බබළන හිරු මඬල පරිද්දෙන්

(iii) මනෝහර වූ/ලස්සන වූ/උස මහතින් යුක්ත රූපයක් වෙම් වා

(iv) මුළු ශරීරයෙන්ම/සකල ශරීරයෙන්

(උ)

(i) කපුරු මාල

(ii) සැප සම්පතින් දිව්‍ය ලෝකය පරදන සියලු යස ඉසුරින් පිරි

(iii) අඩුවක් නැතිව ආභරණ පැළඳගෙන, සැර සී, නිරන්තරයෙන් නගරයේ කාන්තාවෝ ක්‍රීඩා කරති

(iv) දිව්‍ය ලෝකය

(ඌ)

(i) දඹදෙණි යුගයේ විසූ ධර්මසේන හිමි විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවෙන් උපුටා ගන්න ලදී. තම පුතු වන මට්ටකුණ්ඩලීගේ රෝගී තත්වය දුටු අදින්න පුබ්බක බමුණාගේ බිරිඳ විසින් ඒ පිළිබඳ අදින්න පුබ්බක බමුණාට කියන අවස්ථාව හා සබැඳේ.

(ii) කුරුණෑගල යුගයේ ලියවුණු පන්සියපනස් ජාතක පොතේ එන චන්දකින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. බඹදත් රජු කිඳුරාට හීයෙන් විද, කිඳුරා සිහිසුන්ව සිටින අවස්ථාවේ දී කිඳුරිය විසින් බඹදත් රජුට බැනවදින අවස්ථාව හා බැඳේ.

(iii) මාර්ටින් වික්‍රමසිංහ විසින් රචිත වහල්ලු කෘතියෙන් උපුටාගත් වහල්ලු කෙටිකතාවේ එන්නකි. උපාලිස් දිනක් තම කරත්තයෙන් මගියෙක් ගෙනයන විට මුදලාලි යන්නේ උසාවියට ද? යි උපාලිස් ඇසූ විට මගියා විසින් උපාලිස්ට කියන ලද්දකි.

(iv) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද ‘පෙමතො ජායතී සොකො’ නාට්‍යයේ එන්නකි. උද්දාල බමුණා ස්වර්ණතිලකා දැකීමෙන් පසු ඇය කෙරේ තම සිත ඇදී ගොස් සිත හදාගත නොහැකි බව තම ගෝලයන්ට (අග්නි දත්තට) පවසන අවස්ථාව හා බැඳේ.

(v) දඹදෙණි යුගයේ විසූ මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍රහිමි විසින් රචිත පූජාවලිය ග්‍රන්ථයේ එන අනුරුද්ධ කුමාර කතාවෙන් උපුටා ගන්නා ලද්දකි. බුදුන් සමීපයෙහි මහණ වීමට කැමති දැයි මහානාම කුමාරයා විසින් අනුරුද්ධ කුමාරයාගෙන් ඇසූ අවස්ථාවේ දී අනුරුද්ධ කුමාරයා විසින් මහානාම කුමාරයාට කියන ලද්දකි.

(vi) ලෙනාඩ් වුල්ෆ් මහතා විසින් රචිත බැද්දේගම නවකතාවේ සිලිඳු මිදුලේ ඇනබාගෙන සිටින විට ඔහු ළඟට පැමිණි පුංචි මැණිකා ඔහුගේ දණට අත දී මුහුණ දිහා බලා සිටින අවස්ථාවේ දී සිළිඳු විසින් පුංචි මැණිකාට කියන ලද්දකි.

(vii) දඹදෙණි යුගයේ විසූ මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලිය ග්‍රන්ථයේ එන අනුරුද්ධකුමාර කතාවෙන් උපුටාගත් පාඨයකි. රජ දරුවෝ සදෙනා විසින් පළමුව උපාලි කපුවා මහණ කරන්නැයි බුදුන් වහන්සේගෙන් ඉල්ලන අවස්ථාව හා බැඳේ. රජ දරුවන් සදෙනා විසින් බුදුන් වහන්සේට කියන ලදී.

සිංහල II පත්‍රය

12 ශ්‍රේණිය

(1)

| | |
|---|---|
| 01 - 3 | 11 - 1 |
| 02 - 2 | 12 - 3 |
| 03 - 2 | 13 - 3 |
| 04 - 3 | 14 - 5 |
| 05 - 4 | 15 - 2 |
| 06 - 1 | 16 - 4 |
| 07 - 2 | 17 - 3 |
| 08 - 4 | 18 - 5 |
| 09 - 3 | 19 - 1 |
| 10 - 3 | 20 – 4 |

2. (අ)

(i) මිනිසුන් නිසර්ගයෙන්ම විසිතුරු සිරිත්වලින් බැඳී පද්‍යාන්ට කැමති හෙයින්.

(ii)

- නොයෙක් කරුණු මුල් කරගෙන බැඳ තිබීම.
- අර්ථ රසයෙන් වැඩි පොහොසත් බවක් නොමැති වීම.
- ශාස්ත්‍රයෙන් බොහෝ දුර වීම.

(iii)

- මැලිකම් මග හරවා ජාතීන් නගා සිටු වීම.
- වෙනස් කළ නොහැකි සේ මුල් බැසගෙන පරම්පරාගතව පැවත එන අදහස් වෙනස් කිරීම.

(iv) මිතුරන් සුවපත් කිරීමටත් සතුරන් දුප්පත් කිරීමටත් ශාස්ත්‍රානු කූලව නිබන්ධ පද්‍යයන් අතිශය උපකාරී වන බව.

(v)

- නෛසර්ගික ප්‍රතිභානය
- බහුශ්‍රැතභාවය
- නිරන්තර අභ්‍යාසය

(vi) අතීත ජාතීන්හි කාව්‍යාලංකාරාදිය සේවනය කිරීමෙන් වූ වාසනා බලයෙන් ඇති වෙන වහා වැටහෙන නුවණයි.

3. රචනයට නියමිත ලකුණු ලබා දෙන්න.

4. (අ)

I. ඇගේ මුහුණ පියුමක් මෙන් බබළයි.
II. නිවැරදි වාක්‍යකි.
III. අප පාරේ දකුණු පසින් ගමන් කළ යුතුය.
IV. ආරාධිතයින් පැමිණෙද්දී පිරිස හුනස්නෙන් නැගී සිටියහ.
V. මහගමසේකර කවියෙකු මෙන්ම චිත්‍ර ශිල්පියෙක් ද විය.

(ආ)

I. සුභසාධක සංගමය විසින් සාමාජික සාමාජිකාවෝ දැනුවත් කෙරෙති./කෙරෙත්/කරනු ලබත්/ලැබෙත්/ලබති/ලැබෙති.
II. නා හිමියන් විසින් උත්සවයේ මුලසුන හෙබවිණි./හොබවනු ලැබිණ/හොබවන ලදී/ලැබුවේය.
III. කුඩා දරුවෙකු විසින් උත්සව භූමියට මම කැඳවාගෙන යනු ලැබුවෙමි./ලැබීමි/ලදිමි.
IV. ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් නව විදුහල්පතිනිය සාදරයෙන් පිළි ගැනිණි./පිළි ගැනුණාය/පිළි ගනු ලැබුවාය/පිළිගන්නා ලද්දීය.
V. පොලිස් නිළධාරීන් විසින් සැක කරුවෝ උසාවියට ඉදිරිපත් කෙරුණහ./කරනු ලැබූහ/කරන ලදහ/ලද්දෝය.

(ඉ)

I. කම්කරුවෝ - කළහ.
II. ගුරුවරියක් - මා
III. රචකයන් - මවන්නෝ
IV. අපි - නිළියක
V. විචාරයෙකු - දේශකයෙක්

| 5. | වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
| --- | --- | --- | --- |
| I. | විශිෂ්ට | උපසර්ග | වඩා යන අර්ථය, අර්ථෝද්දීප |
| | මහතාගේ | විභක්ති | සම්බන්ධ විභක්ති, සබඳ විබත් |
| | ප්‍රභාවත් | තද්ධිත | "ඇත්තේය" යන අර්ථය, අස්ත්‍යර්ථය |
| II. | ළා හිරු | සමාස | විශේෂණ සමාසය, විශේෂණ පූර්ව පද |
| | පායද්දී | ක්‍රියා | අසම්භාව්‍ය ක්‍රියා, කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා |
| | වනමල් | සමාස | ආධාර විභක්ති සමාස, අදර විභත් සමස් |
| III. | නීලෝත්පල | සන්ධි | ස්වරාදේශ සන්ධිය |
| | සරන | කෘදන්ත | වර්තමාන කාල කර්තාරක කෘදන්ත |
| | වනසත්තු | සමාස | ආධාර විභක්ති සමාසය |
| IV. | ඔවුනොවුන් | සන්ධි | ස්වර සන්ධිය |
| | බලා | ක්‍රියා | පූර්ව ක්‍රියා |
| | බොකුටු | තද්ධිත | බොහෝ වූයේ යන අර්ථය, බහුලාර්ථය |
| V. | තුරු | නිපාත | සීමාර්ථයෙහි නිපාත |
| | සුදන | උපසර්ග | 'වඩා'යන අර්ථය, අර්ථෝද්දීපනය |
| | ලබම්වා | ක්‍රියා | ආශිර්වාද ක්‍රියා |

6. (අ) (i) ග්‍රාම

(ii) විදෙස්

(iii) උරන

(iv) විදේශීය

(v) ගම්

(vi) උරණ

(ආ)

| | | | |
|---|---|---|---|
| i. | වෙදැදුරු | iv | වැල්ලවුරු |
| ii. | ලිග්ගල | v | මුනීන්ද්‍ර |
| iii. | සුණුවම් | vi | පිළිතුරු |

(ඉ)

i. පාලකයිනි - ආලපන විභක්තිය/අලප් විබත්
ජනතාවගේ - සම්බන්ධ විභක්තිය/සබඳ විබත්

ii. දිළින්දන්ට - සම්ප්‍රදාන විභක්තිය/සපදන් විබත්
බොජුන් - කර්ම විභක්තිය/කම් විබත්

iii. ඔහු - ප්‍රථමා විභක්තිය/පෙර විබත්
පොරොවෙන් - කරණ විභක්තිය/කරණ විබත්

(ඊ)

i. ක්‍රි.ව. 8 -18 දක්වා කාලය මධ්‍යතන සිංහල අවධියයි.
ii. “අද මාගේ මන දොළ මුදුන් පැමිණෙන්නේය”යි දේවතාවා සිතීය.
iii. “අයියෝ ! දැන් ඉතින් අප්පොච්චි එල්ලා දමයි ද?”

(උ)

i. තමාට එහි නවාතැන් දෙන ලෙස ආගන්තුකයා කීවේය.
ii. තමන් සියලු දෙනා විභාගය උසස් ලෙස සමත් වන බව ශිෂ්‍යයෝ ප්‍රකාශ කළහ.
iii. සිංහල ව්‍යාකරණ රීති හොඳින් අධ්‍යනය කළ යුතු බව භාෂා වේදීහු ප්‍රකාශ කළහ.

7.

i. අභාවයට, ඇසළ, කලාකරුවන්ගේ, බෞද්ධාගමික, මහනුවර, සංදර්ශනය, සංස්කෘතික
ii. හැඩ රුවක් - කෙටි ඇදය, කෙටි පාපිල්ල, හල් කිරීම
සංස්කෘතික - හල් කිරීම, ගැටය සහිත ඇල පිල්ල, කෙටි ඉස් පිල්ල
කියැවේ - කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය, කොම්බුව හා හල් කිරීම

iii.

1. ක්‍රියාකාරීත්වය
2. භක්තිමත්/බෞද්ධාගමික
3. සංදර්ශනය/සංවිධානය/රාජසිංහ

iv. ජාතික + උත්සවයක් - ස්වරාදේශ සන්ධිය
ඔවුන් + ඔවුන් - ස්වර සන්ධිය
බෞද්ධ + ආගමික - සමාන ස්වර දීර්ස/ස්වරාදේශ

v. සපයමින්
දුන්හ
විදේශික/සංස්කෘතික/බෞද්ධාගමික/ආගමික



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න